# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1991/5 - 2016 ඔක්තෝබර් මස 31 වැනි සඳුදා - 2016.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**අත්කර ගැනීමේ පනත (460 වන වගන්තිය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : MTR/LND/ACQUI/LI/3943.

*ඉ.අ. යොමු අංකය* : 4/3/15/2011/වීර්/231.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යයතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනත්තගොඩ උතුර ගමේ කැඩැස්තර සිතියම් අංක 820010 කලාප අංක 02 පත්‍ර අංක 02 පිඹුරේ කැබලි අංක 162 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාතර වැවහමන්දුව 2003 ගංවතුර ව්‍යවසනයෙන් අවතැන් වූවන් සඳහා විකල්ප ඉඩම් දීමට ඉඩම් අත්කර ගෙන තිබේ.

**උපලේඛනය**

01. **කැබලි අංක 162**

ඉඩමේ නම: පුවක්වත්ත *හෙවත්* තල්ගස්පිට්ටනිය; ඉඩමේ විස්තරය: ගෙවත්ත අවුරුදු දහයක් (අවු. 10 ක්) අවුරුදු විස්සක් (අවු. 20 ක්) පමණ වයසැති මිශ්‍රභෝග වගාවක් සහ ස්ථිර ගෙඩනැගිලි 10ක් ඇත; ඉඩමේ මුල් හිමිකම කියන්නා: විහාරාධිපති පූජ්‍ය හක්මණ ධම්මරතන හිමි, කොටිකාගොඩ රජමහා විහාරය, වැවහමන්දුව, මාතර; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.3324.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 නොවැම්බර් මස 10 වන දින පෙ.ව. 10.30ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය. තව ද 2016 නොවැම්බර් මස 01 වන දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

රංජිත් යාපා,
ප්‍රාදේශීය ලේකම්.
මාතර.

මාතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 690

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1A - G 024463 - 17 (2016/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.